කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2013

2016 - ඔක්තෝබර්

**BCOME 4564** - බැංකු නීතිය හා පරිචය

ප්‍රශ්න සංඛ්‍යාව : (හතයි) 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්නය පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. " ශ්‍රී ලංකාවේ බැංකු නීතියේ මූලාශ්‍ර අදාල ඉංග්‍රිසි නීතිය ඇසුරෙන් සාකච්ඡාවී තිබේ. ඒ අනුව දේශීය ව්‍යවස්ථා දායකය විසින් සම්මත කරන ලද අණපනත් ශ්‍රී ලංකාවේ බැංකු නීතියේ මූලාශ්‍ර ලෙස වැදගත් වේ. " විමසන්න.

(ලකුණු 20 යි)

02. ශ්‍රී ලංකාවේ ස්ථාවර මූල්‍ය හා බැංකු පද්ධතියක් ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා මහබැංකුවේ කාර්ය භාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි )

03. බැංකු නීතියේ ඉතා වැදගත් ලෙස ස්ථාපිත වී ඇති රීති වලින් එකක් නම් තම ගනුදෙනු කරුවන්ගේ ගිණුම් සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාවයක් පවත්වා ගත යුතු බවයි. නමුත් මෙම රහස්‍යතා රීතිය අසීමිත රීතියක් නොවන අතර, ඒ සඳහා ව්‍යතිරේක තිබේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

04. අ. කඩවත මහජන බැංකුවේ ජංගම ගිණුමක් හිමි රංග රුපියල් 3000 /- ක් සඳහා චෙක්පතක් සුනිල්ට නිකුත් කරයි. සුනිල් එම චෙක්පත වංචනික ලෙස රුපියල් 8000/- ලෙසට වෙනස් කොට එය ආනන්දට ගනුදෙනු කරයි. ආනන්ද එම චෙක්පත, සද්භාවයෙන් හා ප්‍රතිෂ්ඨාවකට ලබාගෙන, ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කළ ද, ගෙවීම් කිරිමට ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති බව සඳහන් කරමින් බැංකුව එම චෙක්පත අගරු කරයි. ඉහත පාරශවයන් ගේ නෛතික තත්ත්වය සාකචඡා කරන්න.

(ලකුණු 12 යි)

ආ. රංග රුපියල් 3000/- ක් සඳහා වූ, චෙක්පත නිකුත් කර ඇත්තේ " ගනුදෙනු කළ නොහැකිය" යන රේඛනය සහිතව නම්, ඉහත පාර්ශවයන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 08 යි.)

05. බැංකුකරු හා ගනුදෙනු කරු අතර පවතින්නේ ගිවිසුම් සම්බන්ධතාවයකි. මෙම ගිවිසුම් සම්බන්ධතාවය මත ඒ හා සබැදි තවත් සබදතා කීපයක් දෙපාර්ශවය අතර පැන නැගී ඇත. වඩා දුරට මෙම සබදතාවය නිසා විශේෂ අයිතිවාසිකම් හා යුතුකම් ගණනාවක් දෙපාර්ශවය අතර හටගෙන තිබේ. සාකාච්ඡා කරන්න.

(ලකුණු 20 යි.)

06. අ. A කඩවත මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුමක් පවත්වා ගන ගියේය. ඔහුගේ භාර්යාව වන B තම ස්වාමි පුරුෂයාගේ අත්සන ව්‍යාජ ලෙස යොදා ඔහුගේ ජංගම ගිණුමෙන් මුදල් ලබාගැනීමට පුරුදුව සිටියාය. A පසුව මෙම ක්‍රියාව දැනගත් නමුත් බැංකුවට දන්වූයේ නැත. භාර්යාවගේ මරණින් පසුව A තමාගේ ගිණුමෙන් අනවසරයෙන් මුදල් හර කිරීම පිළිබඳව බැංකුවට එරෙහිව නඩු පැවරීය.

ඉහත පාර්ශවයන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි.)

ආ. චෙක්පත් ගනුදෙනු කිරීමේ දී ගෙවන බැංකුවට ලබා ගතහැකි නීතිමය ආරක්ෂාවන් විස්තර කරන්න.

(ලකුණු 10 යි.)

07. පහත සඳහන් මාතෘකා 02 ක් පිළිබඳ සටහන් ලියන්න.

අ. පොරොන්දු නෝට්ටු

ආ. චෙක්පත් රේඛනය කිරීම.

ඇ. යථාකාලින ධාරක

ඈ. චෙක්පත් පිටසන් කිරීම.

(ලකුණු 10 බැගිනි මුළු ලකුණු 20 යි. )